# ඓතිහාසික පිළිකුත්තුව රජ මහා ලෙන් විහාර සංකීර්ණය
සහ ගම්පහ දිස්ත්‍රික්කයේ රාවනා යුගය

මෙම සංචාරයේ අරමුණ: ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට වර්තමාන යුගය දක්වා වූ ඉතිහාස කරුණු හැදෑරීම.
දිනය : 2015සැප්තැම්බර් 24 වන දින.
සහභාගී වුවන් ගණන: 4(නිශාන් කුළසිංහ, මාගේ පුත් සහිරු කුළසිංහ, ලසිත රත්නායක, රොෂාන් පෙරේරා)
ගමන් කල ආකාරය: පුද්ගලික මෝටර් රථයෙන්.
විශේෂ ස්තුතිය: ගමනට අවශ්‍ය තොරතුරු හා සිය නිවසේදී අප හට දහවල් අහාරය සැපයූ ප්‍රදේශවාසී අප මිත්‍රකලන කුමාරසිංහ හට.
මෙම වාර්තාව සැකසූයේ: නිශාන් කුළසිංහ විසිනි.

**කොළඹ-මහනුවර A1 මාර්ගයේ සිට පිළිකුත්තුවට ගමන් මාර්ග**

- කොළඹ - නුවර මාර්ගයේ ගම්පහ මිරිස්වත්ත හන්දියෙන් වතුරුගම මාර්ගයේගමන් කර (ජම්බෝලගස් හන්දියෙන්)වමට හැරී ගිය විට විහාරස්ථානය හමු වේ (සම්පූර්ණ ගමන කිලෝමීටර් 5.3ක් පමණ).
- යක්කල හන්දියෙන් කිරිදිවැල මාර්ගයේ කිලෝමීටර් 3ක් පමණ ගමන් කිරීමෙන්ද පිළිකුත්තුව ගම්මානයට පිවිසිය හැක.



ගම්පහ මිරිස්වත්ත මංසන්ධියේ සිට හා යක්කල මංසන්ධියේ සිට පිළිකුත්තුවට ගමන් මාර්ග

www.Lakviskam.org

**පිළිකුත්තුව**

පිළිකුත්තුව යන නාමය එම ගම්මානය හා විහාරස්ථානය හැඳින්වීමට භාවිතා කරනු ලබයි.මුහුදු මට්ටමේ සිට අඩි 400-450ක් අතර උසකින් පිහිටි පිළිකුත්තුව සියනෑ කෝරලයේ පහතරට සිංහලයින්ගේ මුල් ජනාවාස පැතිර තිබූ ප්‍රදේශයක් ලෙස සැලකේ.ක්‍රි.පූ.1ත් - 3ත් අතර සියවස් වලට අයත් අයත් බ්‍රාහ්මීය අක්ෂර සෙල්ලිපි 3ක් සහිත, ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට භාවිතා කල ගල්ලෙන් 99කින් යුක්තව අක්කර 200ක භූමි ප්‍රදේශයක් පිළිකුත්තුවට අයත් වේ. මින් අක්කර 48ක පමණ ප්‍රදේශයක විහාර භූමිය පැතිර ඇත. එය වර්තමානයේ බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිළිකුත්තුව ග්‍රාම නිලධාරී වසමට අයත් වේ. මෙහි ලෙන් කිහිපයක සිදු කල කැනීම් වලින් බලංගොඩ ආදී මානවයාට සම්බන්ධ මෙවලම්, කාලරක්ත මැටි භාණ්ඩ කැබලි, සත්ව ඇටකටු වැනි දෑ සොයාගෙන ඇත. දේවානම් පියතිස්ස රජු කාලයේ සිටම මෙම ස්ථානය ආරණ්‍යයක් ලෙස පැවතුනු බවට සැලකේ. ක්‍රි.පූ. 103-104 කාලයේදී අනුරපුර රජකම් කල වළගම්බා රජු (වට්ට ගාමිණී අභය) සිය රාජ්‍යට එල්ල වූ සොළී ආක්‍රමණ නිසා බේරී පලාවිත් වර්තමාන බස්නාහිර පළාත ආශ්‍රිත වනාන්තරයන්හී සැඟවී සේනා සංවිධාන කර ක්‍රි.පූ. 88 දී අනුරාධපුර රාජ්‍ය බලය නැවත අල්ලා ගන්නා ලදී.

වළගම්බා රජු එවකට පිළිකුත්තුව, වාරණ, මාලිගාතැන්න ආශ්‍රිතවද සැඟවී සිට ඇත.පිළිකුත්තුව අතීතයේදී ඌරුවල ගොඩ ගෙදර නමින්ද හැඳින් වූ බවට රාජමහා විහාර නම් පුස්තකයක සඳහන්ව ඇත.රජතුමා හට රෙදිපිළි සම්පාදනය කල ප්‍රදේශයක් වූ නිසා පිළිකුත්තුව නාමය පටබැඳුනු බවට අදහසක් ඇත.එසේම වළගම්බා රජතුමාගේ බිසව වූ සෝමා දේවියගේ ඇඳුම් ආදිය මෙම ප්‍රදේශයේ සඟවා තැබූ නිසා එම නම පටබැඳුනු බවට තවත් ජනප්‍රවාදයකි. තවද පිළිකොටුව, මල් කොටුව, ආරච්චි කොටුව, බිලිගහ කොටුව, හාල්පත් කොටුව, යන කොටු ගම් නම් එකතු වී පිළිකොටුව ලෙස භාවිතා වී පසුව පිළිකුත්තුව ලෙසින් භාවිතා වී ඇති බවට තවත් ජනප්‍රවාදයකි. පිළිකුත්තුව විහාර භූමියේ ඇති ප්‍රධාන සෙල් ලිපියේ "අනාගතයේ හා වර්තමානයේ සතර දිගින් වඩිනා සංඝයා සඳහා අශ්වාරෝහක නිලධාරියාගේ සොහොයුරු අග්ගිභූතිගේ දානයයි" යනුවෙන් සඳහන්ය. එයින් කියවෙන්නේ සංඝයා වහන්සේට පූජා කිරීමක් පිළිබඳවය."පටියත්ත" යන පාලි වදනෙහි අදහස නැවත කරවූ යන්නයි. රජු තමන්ට ආරක්ෂාව ලබා දුන් ගල් ලෙන් ආශ්‍රිතව විහාර ආදිය ගොඩනංවා සංඝයා වහන්සේට පූජා කිරීමට බාර වූ නිසා "පටියත්ත" වදන ආශ්‍රයෙන්සංඝයාවහන්සේ වෙත නැවත කරවා පූජා කිරීම යන අරුතෙන් පිළිකුත්තුව නාමය නිර්මාණය වූ බවටද අදහසක් පවතී.

උතුරු දෙසින් යොන්ගම්මුල්ල ගම්මානය සහ වාරණ කඳු වැටියත්, දකුණින් දහම් කන්ද වටකරගත්හේනෙගම, කැරගල, වල්අරඹ, ලුණුගම සහ දොම්පෙ ගම්මාන රැසක් මේ වන අරණට සදා රැකවරණයසපයයි. එසේම පිළිකුත්තුව ආශ්‍රිතව පිහිටා ඇති තවත් ගම්මාන එම ඓතිහාසික බවට නෑකම් කියන බවට ජනශ්‍රැති අධ්‍යනයෙන් වටහා ගත හැක.එකල යුද්ධය සඳහා භේවායන් බඳවාගත් ගම "යොන් ගම" ලෙසත්, භේවායන් රැස් කල ප්‍රදේශය "බටේපොළ" ලෙසත්,  යුද්ධයට අවශ්‍ය අවි ආවුද තැනූ ගම"කිණිහිරගම"ලෙස හඳුන්වා ඇත. පසුව එය "කීණිගම" ලෙස භවිතා වේ. භේවා බල ඇණි වලට බත් දුන් ප්‍රදේශය"බත්පිටිය" ලෙස ව්‍යවහාර වී පසුව "බුත්පිටිය" ලෙසත්, දළදා සමිඳු වැඩ සිටි සමයේදී දන්තධාතූන් වහන්සේ  තැම්පත් කල ප්‍රදේශය මාලිගාතැන්නලෙසත්, දන්තධාතුව සඳහා ඉදි කල රහස් කුටිය සඳහා පස් ලබා ගත් ප්‍රදේශය "පස්ගම්මන" ලෙසත්, දළදා පිදීමට මල් ලබා ගත් ප්‍රදේශය "මල්වතු හිරිපිටිය" ලෙසත් පටබැඳි ඇත. රජුගේ උයන් පිහිටි ප්‍රදේශය "උයන්බඩ" නම් වීය.

පිළිකුත්තුව වනාන්තරය 2003 නොවැම්බර් 3 දින වෘක්ෂ අභයභූමියක් ලෙස ප්‍රකාශ කර ඇත. මෙම වනාන්තර ආශ්‍රිත අභය භූමියේ දක්නට ඇති ශාඛ අතර පුස්වැල්, මා වේවැල්, බට, නා, නුග, ඉදි, කිතුල්, ගොඩපර, කළුවර, වල්දෙල්, ඇටඹ, දොඹ, රුක්අත්තන, ගල් කරඳ, හොර, මිල්ල, හල්මිල්ල, සියඹලා, දළුක්, කොලොන්, හාතවාරිය, පතොක්, අක්කපාන, නවහන්දි, නිල් මොනරැස්ස, වලිස්නේරියා, බුදුරැස්ස  ආදිය ප්‍රධාන තැනක් ගනී. එසේම මත්ස්‍ය වර්ග 20ක්, සමනල වර්ග 40ක්, මල් කොට්ටෝරුවා, ලංකා සැළලිහිණියා, ගිරා මලිත්තා, වළි කුකුළා, මහ කුරුමිණි කුරුල්ලා, සුදුරෙදි හොරා, කොන්ඩ රාජාලියා, සර්ප රාජාලියා, දුඹුරු ඇහි පටියා වැනි පක්ෂීන් වර්ග 75ක් ද එහි වේ. පිඹුරා, නාගයා, කුණකටුවා, තිත් පොළඟා, ඇහැටුල්ලා වැනි උරගයෝද වෙති. ක්ෂීරපායී ගණයට අයත් හඳුන් දිවියා, නරියා, කොළ වඳුරා, ඉත්තෑවා මීමින්නා, හාවා, උණහපුලුවා, වැනි සතුන්ද දක්නට ඇත.

www.Lakviskam.org

**ගමන ආරම්භ කරමු**

බෞද්ධ විහාරස්ථානයක් නිසා සංවර සුදු ඇඳුමකින් සැරසී මෙම ස්ථානයට යන්න. ඔබ වාහනයකින් පැමිනෙන්නේ නම් එය විහාරස්ථානය ඉදිරිපිට පොල්වත්ත අසල නතර කල යුතුය. ඉන් පසු මෑතකාලීනව ඉදි කරන ලද විශාල තොරණ අසලින් විහාරස්ථානයට ඇතුළු විය හැක. ඔබට මුලින්ම ඇස ගැටෙනු ඇත්තේ පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති බව හඟවන නාම පුවරු කිහිපයයි.මෙහිදී ඔබ මතක තබා ගත යුතු විශේෂතම කරුණක් වනුයේ මෙම භූමිය පුරාවිද්‍යා රක්ෂිතයක් හා වෘක්ෂ අභයභූමියක් බැවින් යම් යම් සීමා පනවා තිබිය හැකි බවයි.ඡායාරූප ගැනීමේදී , යම් උපකරණ ගෙන යාමේදී, ඇතැම් ස්ථාන වලට ඇතුළු වීමට පවා නිසි අවසරයක් අවශ්‍යවීම ආදී සීමාවන් පැවතිය හැක. වනාන්තරය තුලට පොලිතින් ගෙනයාම සපුරා තහනම්ය.



පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුවේ මග පෙන්වන පුවරු


ලෙන් විහාරය හා චෛත්‍යය

විහාර භූමියඇතුලට ගමන් කිරීමෙන් පසු දකුණු අත දෙසින් කළුගලක් මත පිහිටුවා ඇති සන්ටාර කුළුනත් ඉංග්‍රීසි, ඕලන්ද, මහනුවර යුග වලටඅයත් සංඝ ආවාස ගෙවල් දක්නට ඇත. ඒ දෙසට ගමන් කර මහනුවර යුගයේ ලෙන් ආවාස අතරින් ගියවිට ඉපැරණි දැවමය පාලම හමු වේ.ඊට ඔබ්බෙන් පැරණි වැව දක්නට ලැබේ. ආපසු හැරී විහාරස්ථානයට ඇතුල් වූ ස්ථානයට ගමන් කිරීමේදී ධර්ම ශාලාව හා පැරණි පොකුණ දක්නට ලැබේ. භූගත ජල මාර්ගයක් ඔස්සේ මෙම පොකුණට ජලය ලැබෙන බවට කියවේ.ඉන්පසු හමුවන්නේ ඉපැරණි ''කුමර, කුමරි''බෝධීන් වහන්සේ දෙනමයි. මින් විශාලව කෙලින් වැඩුණු බෝධිය ''කුමර බෝධිය'' ලෙසත් අනෙක ''කුමරි බෝධිය'' ලෙසත් හඳුන්වයි.


ඓතිහාසික දැවමුවා පාලම


කුමර කුමරි බෝධිය

www.LakViskam.org

ඉන්පසු ඔබට හමුවන්නේ ලෙන් විහාරයයි.ස්වභාවික වටදාගෙයකින් ආරක්ෂා වූ චෛත්‍යකින් යුතු මෙම විශාල ලෙනට ඉහලින් කටාරම් කොටා ඇති අතර පසුකාලීනව මෙම විහාරගෙය සාදන්නට ඇත. සමාධි පිළිමය, සැතපෙන පිළිමය, හිටි පිළිමය වශයෙන් බුදු පිළිම තුනක් විහාර ගෙය තුල පිහිටුවා ඇත. මහනුවර යුගයට අයත් දර්ශණීය බිතු සිතුවම් රැසක් දක්නට ඇත. මහා කප්ප, වෙස්සන්තර, ධර්මපාල ජාතකය ආදී ජාතක කතා මෙම සිතුවම් වලින් නිරූපණය කර ඇත.දොරටු පාල රූප සිතුවම් කර ඇත්තේ ලන්දේසි සොල්දාදුවකුගේ පරිද්දෙන්ය. සැතපෙන පිළිමය අසල මෙහෙණින් වහන්සේලාගේ සිතුවම් දක්නට ඇත. ලග්න පිළිබිඹු වන ආකාරයට ලෙනේ ඉහල කොටස සිතුවම් කර ඇත. සමහර බිතු සිතුවම් අපැහැදිලි වී විනාශ වී යන ස්වභාවයක්ද දක්නට ඇත. නිසි සංරක්ෂණයට වහා පියවර නොගතහොත් ඒවා අනාගත පරපුරට අහිමි වනු ඇත.



විහාර ගෙය ඇතුලත



විහාර ගෙය ඇතුලත  බිතුසිතුවම්

www.LakViskam.org

විහාර ගෙයින් පිටතට පැමිණ කුඩා චෛතයය අසලින් උඩට ගිය විට නැවත දැවැන්ත ලෙනක් හමුවන අතර ඒ අතරින් ඉහලට ගමන් කල යුතුය. මෙතැන් සිට සෑම දෙසින්ම පැරණි ගල් ලෙන් හමු වන අතර සමහර ලෙන් මැටි බිත්ති බැඳ කාමර සේ ආවරණය කර තිබෙනු දක්නට ඇත. නමුත් එම බිත්ති ගරා වැටී ඇත. ගස් වැල් සහිත වන පෙතේ ඉහලටම ගමන් කල විට "දබිනි" ලෙන ආසන්නයෙන් විශාල එළිමහන් ගල් තලාවකට පිවිසේ. මෙහි ජලය පිරුණු කුඩා පොකුණක් දක්නට ඇති අතර මෙම ගල් තලාවට ඈත ක්ෂිතිජය තෙක් විහිදෙන මනස්කාන්ත දර්ශණ තලයකින් යුක්තය. මෙම ගල්තලාව අවට පතොක් වැනි ශාඛ දක්නට ඇති අතර වනාන්තරය තුලින් නැගී සිටින අමුතු රටාවන් සහිත ගල් පර්වතද දක්නට ලැබේ. නැවත වනාන්තරය තුලට පිවිස ගමන් කිරීමේදී ඔබට විවිධ වර්ග වල පක්ෂීන් මුණ ගැසෙනු හෝ හඬ ඇසෙනු ඇත. මෙහිදී අපට ලංකා සැළලිහිණි පක්ෂීන් කිහිප දෙනෙකුම හොඳින් බලා ගැනීමට හැකි විය.



කුඩාපොකුණක් සහිත ගල් තලාව



ලංකා සැළලිහිණි සමුහයක්

විශාල මදුරු ගහනයක් සිටින නිසා මාගේ පුංචි පුතුට උන්ගෙන් දැඩි බාධා එල්ල විය. වනාන්තර තුලින් විහිදුනු අඩි පාර යකඩ වැටක් සහිත ගල් පඩිපෙළකට යොමු විය.ඒ ඔස්සේ ඉහලට නැග විශාල එළිමහන් ගල්තලාවකට පිවිසිය හැකි විය. එළිමහන් ගල් තලාව ඔස්සේ දකුණු දිගින් පර්වතයේ ඉහලටම ගමන් කල හැක. ගලේ මුදුන්ම ස්ථානයට සතර අත මැනවින් දිස් වේ.මේ නිසා එය "බැලුම්ගල" ලෙස හදුන්වයි. මෙම ස්ථානයට ඉදිරිපස (වයඹ දිශාව) දෙස සැලකිල්ලෙන් බැලු විට කටුනායක ගුවන්තොටුපොළට ගුවන්යානා පැමිණෙන ආකාරයත්, උඩරට දුම්රිය මාර්ගය ඔස්සේ දුම්රිය ධාවනය වන ආකාරයත්, වම්පසට (නිරිත දිශාව) වන්නට කොළඹ නගරයේ වරාය ඇතුළු උස් ගොඩනැගිලි සියල්ලත්, හොඳින් දර්ශණය වේ.


කොළඹ නගරයේ උස් ගොඩනැගිලි


මාලිගාතැන්නරජ මහා විහාරය

www.LakViskam.org

බැලුම්ගල පිටුපසින් අන්නාසි වගා කරන ලද භූමියකුත් ඊසාන දෙසින් මාලිගාතැන්නරජමහා විහාර පර්වතය දක්නට ඇත. එසේම ඉහල සිට පහතට ඉරි මෙන් දාර සහිත විශාල ගල් පර්වත කිහිපයක්ද වනාන්තරයෙන් පැනනැගී තිබෙන ආකාරය ඉතාමත් අලංකාර දසුනකි. බොහෝ වෙලාවක් බැලුම්ගල මුදුනේ කාලය ගතකල අප සිවු දෙනා නැවත අඩිපාර දිගේ විහාරයේ පහලට පැමිණියෙමු. "දේවාල ලෙන" තුල පිහිටි පත්තිනි දේවාලය වන්දනා කල අප පුරාවිද්‍යා කාර්යාලය අසලින් විහිදෙන මීළඟ පෙත් මග ඔස්සේ අනෙකුත් ලෙන් නැරඹීමට පිටත්වූයෙමු.


දාර සහිත විශාල ගල් පර්වත


යෝධ පුස් වැල

මෙම පෙත්මග ඔස්සේ ගිය විට යෝධ පුස් වැල, සෙල්ලිපි හා කලින් සඳහන් කල බැලුම් ගලටද පිවිසිය හැකි වේ. ටික දුරක් ගමන් කරන ඔබට විශාල පුස් වැල් ගල් ලෙන් වලට උඩින් විහිදී යනු දැකිය හැක. එම ප්‍රදේශයේදීම ප්‍රධාන යෝධ පුස් වැල දැකිය හැක. මෙය වසර 400කට වඩා පැරණි බවට සැලකෙන අතර කඳේ වටප්‍රමාණය අඩි

06ක් පමණ වේ. ප්‍රමාණයෙන් මෙම පුස්වැල දෙවැනි වන්නේ සිංහරාජ වනාන්තරයේ ඇති යෝධ පුස් වැලට පමණි. මෙම පුස්වැලෙහි මුල කොටස විශාල ගල් දෙබොක්කාවකින් පැනනගින අතර එය නැරඹීමට නම් මදක් අපහසු ගල් පර්වත මාර්ගයකින් ඉහලටම නැගිය යුතුය. එවිට පුස්වැලේ ප්‍රමාණය පිළිබඳව හොඳින් වටහා ගත හැක.තවත් ඉහලට ගමන් කරන විට ලෙන් කිහිපයක් පසු කර ලෙන් සෙල් ලිපි සහිත ගල් ලෙනට පිවිසිය හැක.

**රාවනා යුගයට පිළිකුත්තුව ඇතුළු ගම්පහ දිස්ත්‍රික්කයේ ඇති සම්බන්ධය**



ප්‍රධාන සෙල් ලිපිය



සෙල් ලිපි

ක්‍රි,පු. 3 (ක්‍රි.ව.1 වන සියවසේ) පූර්ව බ්‍රාහ්මීය අක්ෂරයෙන්, පුරාණ සිංහල භාෂාවෙන් කරවා ඇති සෙල්ලිපියේ සඳහන් වන්නේ " අශ්වාරෝහක නිලධාරියාගේ සොහොයුරු අග්ගිභූතගේ ලෙන පැමිණි නොපැමිණි සතර දිග සංඝයාවහන්සේලාට පූජා කරන ලදී" යනුවෙනි.රාවනා රජුගේ ඇමතියකු වූ මකර ගේ පුත්‍රයකු වන ශෝන සහ රාවනාගේ මුනුපුරු අගියගේ සොහොයුරු වූ අශ්වාරෝහකයා කර වූ ගල්ලෙන් 100ක් සහිත විහාරය ලෙසද පිළිකුත්තුව සේ සලකයි (2005 බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පුර විද්‍යා ගවේෂණ වාර්තාවක දැක්වෙන පරිදි).රාවනා රජුගේ යක්ෂ ගෝත්‍රික ජනතාව ජීවත් වූ තවත් ප්‍රදේශයක් ලෙස සැලකෙන මෙම පිළිකුත්තුව, වාරණ, හා මාලිගාතැන්න ප්‍රදේශය ක්‍රි.පු, 1800 දී පමණ රාම-රාවනා යුධ ගැටුම් සිදු වූ ප්‍රදේශයක් බවටද විශ්වාස කෙරේ.එකල මාලිගාතැන්න රාවනාගේ මාලිගා සංකීරණයක් වන්නට ඇතැයිද පිළිකුත්තුවද ඊට අනුබද්ධ භූමියක්ව පවතින්නට ඇතැයි අදහසක් පවතී.රාවනාගේ අභාවයෙන් පසු ඔහුගේ සොහොයුරු විභීෂණව රාමා විසින් වර්තමාන ගම්පහ දිස්ත්‍රික්කයේ කැලණිය කේන්ද්‍ර කර ගනිමින් ලංකා රාජ්‍යයේ ලංකාධීශ්වර ලෙස අභිෂේක කරවන ලදී.විභීෂනගෙන් පැවත ආ පිරිස් ලංකාව පුරාම ජනාවාස පිහිටුවා ගත් බවටද කියවේ. මේ නිසා පිළිකුත්තුව වැනි ප්‍රදේශ එකල රාජ්‍ය පාලනයේදී වැදගත් ස්ථානයන්ලෙස පවතින්නට ඇත. ජනශ්‍රැති අනුව වර්තමාන ගම්පහ දිස්ත්‍රික්කයට අයත් මීගමුවද රාවනා යුගයේදී ජලාශය යන අරුත දෙන "නිගුම්බිල"යන නාමයෙන් හඳුන්වා ඇත. එකල කමලා (කාමච්චි) නම් දෙව් දුවට කැප කල බිලි පූජා දෙන දේවාලයක් තිබී ඇත. රාවනා විසින් සීතා කුමරිය රැගෙනවිත් ලංකාපුරයේ සඟවා ඇති විට ඇය සෙවීමට පැමිණි රාම හා ඔහුගේ සොහොයුරු ලක්ෂමණ අල්ලා ගත් ඉන්ද්‍රජිත් විසින් කෙම්මුර දිනයකදී බිලි පූජා පවත්වා බිල්ලට දීමට නිගුම්බිලයේ සිර කර තබා ඇත. අදාල දිනයේදී බිලිදීමට ප්‍රථමයෙන් "කාමච්ඕඩය" නම් ශුද්ධ ජලාශයේ ජලයෙන් ඔවුන් සෝදා පිරිසිදු කිරීමට ගෙන යන විට හනුමන්තා ගෙම්බෙකුගේ වේශයක් ගෙන එම ශුද්ධ වූ ජලාශයට පැන ජලය අපවිත්‍ර කිරීම හේතුවෙන් රාම හා ලක්ෂමණ බිලි දීමට නොහැකිව නිදහස් වූ බවට ජනශ්‍රැතියේ එයි.

ඉහත සඳහන් කල ස්ථාන සියල්ල දැක බලා ගත් අප නැවත කන්ද බසින්නට වීමු. කෙසේ නමුත් පුරාවිද්‍යා කාර්යාලය එදින වසා තිබුණු නිසා පැරණි දෝලාව අපට දැක බලාගත නොහැකි විය. පුරාවිද්‍යා රක්ෂිතයක් බැවින් මෙහි බොහෝ දෑ සුරැකිව තිබුනත් ඇතැම් ස්ථාන වල ආරක්ෂාව ප්‍රමාණවත් නොවේයයි අපට හැඟුනි. සියලුම ලෙන් ආශ්‍රිතව කැනීම් කටයුතු සිදු කර ප්‍රාග් ඓතිහාසික සාක්ෂි මතු කර ගැනීම් වහා සිදු කරන්නේ නම් මෙම

www.LakViskam.org

ස්ථානයට ඇති වටිනාකම මීට වඩා වැඩි වනු ඇත. ඊට අවශ්‍ය පසුබිම ඉක්මනින් සකස් වේවා යන ප්‍රාර්ථනය ඇතිව පිළිකුත්තුව ඓතිහාසික භූමියෙන් අපගේ සංචාරය අවසන් කර කොළඹ බලාපිටත් වූයෙමු.

**අතිරේක යොමු**

අප සංචාරයේ තවත් ඡායාරූප එකතුවක් පහත යොමුවෙන් නරඹන්න.
https://picasaweb.google.com/102500057347588371605/PilikuththuwaRajaMahaViharaya2015

මෙම සංචාරයේ වීඩියෝ දර්ශණ කිහිපයක් පහත යොමුවෙන් YouTube ඔස්සේ නරඹන්න.
https://youtu.be/KuvPJwSwStE

---

මෙම වාර්තාවේ අයිතිය "ලක් විස්කම්"වෙබ් අඩවිය සතුය.©www.lakviskam.org(2015දෙසැම්බර් 29)
විමසීම්සහ අදහස් : lakviskam@gmail.com

www.LakViskam.org